# IV මහ බැංකු ගිණුම් සහ ගනුදෙනු

1959 මහ බැංකුවේ මූල්‍ය ගිණුම් සටහනෙහි දක්වා ඇත.
1958 හා සසඳන විට පෙණුන ප්‍රධාන වෙනස්වීම් පහත දැක්වේ.

| | වෙනස්වීම් | |
|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | සියයට ගණන |
| සම්පූර්ණ ඉල්ලුම් වගකීම් ... ... ... ... ... ... ... | + 73·2 | + 10·0 |
| නෝට්ටු හා කාසි සංසරණය ... ... ... ... ... ... ... | + 43·0 | + 7·4 |
| ඉල්ලුම් තැන්පතු ... ... ... ... ... ... ... ... | + 30·3 | + 20·0 |
| (එයින් වෙළඳ බැංකු සතු) ... ... ... ... ... ... ... | + 3·9 | + 4·3 |
| ජාත්‍යන්තර සංචිතය ... ... ... ... ... ... ... ... | — 152·0 | — 28·2 |
| දේශීය වත්කම් ... ... ... ... ... ... ... ... | + 252·8 | + 96·9 |
| රජයේ හා රජය සහතික කළ ණය පත් ... ... ... ... ... | + 191·0 | + 124·5 |

— වැඩිවීම

× අඩුවීම

1958 අවසානයේ සියයට 73.8 ක්ව පැවත්, නෝට්ටු, කාසි සහ ඉල්ලුම් වගකීම්වල, ජාත්‍යන්තර සංචිතයේ අනුපාතය, 1959 අවසානය වන විට සියයට 48.2 දක්වා පහළ බැස්සේය.

රන්පවුම්—ඩොලර් ගාස්තු වෙනස්වීම්වලට අනුරූපව, අමෙරිකානු ඩොලරයක මහ බැංකු ගාස්තුව (පළමු වැනි පරිශිෂ්ටයෙහි දක්වා ඇති පරිදි) කලින් කලට වෙනස් විය.

පහත දක්වා ඇති පරිදි අවුරුද්ද තුල රන්පවුමෙහි සහ ඉන්දීය රුපියලෙහි මහ බැංකු ගාස්තුවේ වෙනසක් ඇති නොවුණි.

| | | විදුලි පණිවුඩ මගින් මිල දී ගැනීම | විදුලි පණිවුඩ මගින් විකිනීම |
|---|---|---|---|
| රන් පවුම් .. | එතැන් .. | සිලිං 1 පැ. 63/64 .. | සිලි. 1 පැ. 61/32 |
| (ලංකාවේ රුපියලකට) .. | ඉදිරි .. | මසක වට්ටම් මිල .. | මසක අධි මිල |
| | (හයමාසයක් දක්වා) .. | පැන්ස 1/128 .. | පැන්ස 1/128 |
| ඉන්දියානු රුපියල් .. | එතැන් .. | රුපියල් 99 3/4 .. | රුපියල් 99 13/16 |
| (සියයට) .. | ඉදිරි .. | මසකට වට්ටම් මිල .. | මසක අධි මිල |
| | (හය මාසයක් දක්වා) .. | රුපියලෙන් 1/32 .. | රුපියලෙන් 1/32. |

මහ බැංකුවේ සම්පූර්ණ විදේශීය මුදල් ගනුදෙනු 10 වැනි සටහනේ දැක්වේ. එතැන් මිලදී ගැනුම් රුපියල් කෝටි 17.09ක් වූ අතර එතැන් විකුණුම් රුපියල් කෝටි 49.59ක්විය. මෙය 1959 වර්ෂයේ දී රුපියල් කෝටි 16.79ක් සහ රුපියල් කෝටි 56.78ක් වූයේ ය. ඉදිරි මිල දී ගැනුම් සඳහා බැඳුන ගිවිසුම්වල වටිනාකම රුපියල් කෝටි 21.83ක් වූ අතර, (1958 දී රුපියල් කෝටි 37.02ක් විය.) ඉදිරි විකුණුම් සඳහා බැඳුන ගිවිසුම්වල වටිනාකම රුපියල් කෝටි 5.24ක් විය. (1958 දී රුපියල් කෝටි 9.78 විය.) ඉදිරි මිල දී ගැනුම් ගිවිසුම් යටතේ ගත වූ අවුරුද්දේ ඉතිරිව තුබූ මුදල ද සමඟ රුපියල් කෝටි 24.73ක් ලැබුණ අතර ඉදිරි විකුණුම් ගිවිසුම් විකුනු ප්‍රමාණය රුපියල් කෝටි 8.46ක් විය. සම්පූර්ණ ගැනුම් ප්‍රමාණය (එතැන් සහ ඉදිරි ගිවිසුම් යටතේ) රුපියල් කෝටි 41.82ක් වූ අතර මුළු විකිනීම් ප්‍රමාණය රුපියල් කෝටි 58.05ක් විය.

**ආදයම සහ වියදම**

මහ බැංකුවේ වාර්ෂික ආදයම රුපියල් 2,05,64,703.30ක් වූ අතර, මුදල් පණතේ 38 වැනි වගන්තියේ ප්‍රකාර සංචිත සඳහා වෙන් කරන ලද රුපියල් 82,15,879·78 ඇතුළුව මහ බැංකුවේ වාර්ෂික වියදම රුපියල් 1,55,64,703.30ක් විය. මුදල් පණතේ 39 (ආ) වගන්තියේ ප්‍රකාර ශුද්ධ ලාභය වූ රුපියල් 50 ලක්ෂය අතිරික්තයන්ට බැර කරන ලදි. මෙසේ කරන ලද්දේ 1959 දෙසැම්බර් මාසයේ අවසානයේ දී, මහ බැංකුවේ ප්‍රාග් ධන ගිණුම්හි එකතුව, සම්පූර්ණ බැංකු වත්කම් අතර, සහ එහි විදේශීය මුදලින් ඇති වත්කම්හිත් වෙනසින් සියයට 15කට වඩා, අඩු වූ නිසාය. දැනට අතිරික්තය රුපියල් කෝටි 2.3ක්ව පවතී.

**බැංකු පරිපාලනය**

මුදල් නීති පණතේ 29(1) වන වගන්තියේ ප්‍රකාර, 1959 වර්ෂයේ දී බැංකු පරිපාලන දෙපාර්තමේන්තුව විසින් වෙළඳ බැංකු 11ක් පරීක්ෂා කර බලන ලදී.

මෙ දෙපාර්තමේන්තුව විසින් 1957 අංක 12 දරණ බැංකු හර බඳු පණත ක්‍රියාවේ යෙදීම හා සම්බන්ධ යම් යම් කාර්යයන් ද ඉටු කර ගෙන යන ලදී.

## V පෞද්ගලික

ආතර් රණසිංහ සිරිමතාණෝ 1959 ජුලි 1 වැනි දින සිට අධිපති ධුරයෙන් ඉවත් වූහ. මුදල් නීති පණතේ 12 (1) වන වගන්තියේ නියමයන් අනුව ඩී. ඩබ්ලිව්. රාජපතිරාණ මහතා මහ බැංකුවේ අධිපති වශයෙන් 1959 ජුලි 1 වැනි දින සිට පත් කරන ලදී. 1959 සැප්තැම්බර් 14 වැනිද රාජපතිරාණ මහතා ලන්ඩනයේ පවත්වන ලද පොදුරාජ්‍ය මණ්ඩලයේ මුදල් ඇමතිවරුන්ගේ රැස්වීමට හා වොෂින්ටන්හි පවත්වන ලද ජාත්‍යන්තර මුදල් මණ්ඩලයේ හා ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ අධිපතිවරුන්ගේ රැස්වීමට සහභාගි වීම සඳහා දිවයිනෙන් පිටව ගියේය. ඒ මහතා ආපසු පැමිණියේ 1959 ඔක්තෝබර් 15 වැනි දය.

මුදල් මණ්ඩලයේ පත් කරන ලද සාමාජික ජේ. ත්‍යාගරාජා මහතා 1959 ජුලි 1 වැනි දින් සිට නැවත එම තනතුරට පත් කර ගනු ලැබීය.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ධුරය දරූ ඩී. ඩබ්ලිව්. රාජපතිරාන මහතා දිල්ලි නුවර පවත්වන ලද අග්නිදිග ආසියා රටවල හා නිව්සීලන්තයේ මහ බැංකු අධිපතිවරුන්ගේ සම්මේලනයේ සභා රැස්වීමට සහභාගිවීම අඳහා 1959 පෙබරවාරි මස 28 වැනි දින දිවයිනෙන් බැහැර ගියේය. ඒ මහතා ඇපසු පැමිණ මහ බැංකුවේ වැඩ බාර ගත්තේ 1959 මාර්තු 9 වැනිද සිටය. ඩී. ඩබ්ලිව්. රාජපතිරාණ මහතා දිවයිනෙන් පිට වී ගිය දින සිට ආපසු පැමිණෙන තෙක් නියෝජ්‍ය අධිපති ඩබ්ලිව්. තෙන්නකෝන් මහතා මුදල් නීති පණතේ 24 වැනි වගන්තිය අනුව ජ්‍යෙෂ්ඨ තැන වශයෙන් නම් කරනු ලැබීය.

මහ බැංකුවේ උපදේශක තැන වශයෙන් අවුරුදු දෙකක කාලයක් බැංකු සේවයේ යෙදී මෙන්, ඊ. බී. බෙනට් මහතා 1959 මැයි 1 වැනිද තම සේවා කාලය සම්පූර්ණ කළේය. අධිපතිවරුන්ගේ සහකාර පී. ඈම්. ජයරාජන් මහතා 1959 නොවැම්බර් මාසයේ සිට 1960 ඔක්තෝබර් මාසය දක්වා වූ කාලය සඳහා ජාත්‍යන්තර මුදල් මණ්ඩලයේ මහ බැංකුවේ විකල්ප විධායක අධ්‍යක්ෂක වශයෙන් යවන ලදී. ඒ මහතා විසින් 1955 නොවැම්බර් 1 වැනි දින ජාත්‍යන්තර මුදල් මණ්ඩලයේ වැඩ බාර ගන්නා ලදී. ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් ක්‍රියා කළ ඩී. සී. ගුණසේකර මහතාගේ පත්වීම 1959 ඔක්තෝබර් 31 වැනිද අවසන් විය. ඒ මහතා 1959 නොවැම්බර් 19 වැනිද මහ බැංකුවේ නැවතත් රාජකාරියෙහි යෙදුණු අතර, 1959 නොවැම්බර් 23 වැනිද සිට අධිපතිවරුන්ගේ සහකාර තැන වශයෙන් පත් කර ගන්නා ලදී.